# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1474/5 – 2006 දෙසැම්බර් 06 වැනි බදාදා – 2006.12.06

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

එල්. ඩී. සී. එෆ්. 1/64

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමාණන් විසින් කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

මහින්ද රාජපක්ෂ.

සාමය ඇති කිරීමට සහ ජාතික ප්‍රශ්නය දේශපාලන වශයෙන් විසඳීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව විසින් සද්භාවයෙන් දරන ලද ප්‍රයත්නයන් සහ ගන්නා ලද ක්‍රියාමාර්ග නොසලකාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භෞමික අඛණ්ඩතාවය සහ පරමාධිපත්‍යය, විශේෂයෙන්ම එකී ජනරජයෙන් වෙන්වී, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භූමියෙහි ඇතැම් කොටස්වල වෙනම ස්වෛරී රාජ්‍යයක් පිහිටුවීමේ චේතනාවෙන් යුතුව ඇතැම් තැනැත්තන් සහ සංවිධාන විසින් සිදු කරනු ලබන ත්‍රස්තවාදී ක්‍රියා මගින් තවදුරටත් තර්ජනයට සහ අනතුරට පාත්‍රවී ඇති හෙයින් ද;

එකී ත්‍රස්තවාදී ක්‍රියාවල තීව්‍රභාවය සහ ස්වභාවය, ජාතියේ සහ මහජන ආරක්ෂාවට, ජනතාවගේ, යථා පැවැත්මට සහ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාමට අහිතකර අන්දමින් තවදුරටත් පවත්නා හෙයින් ද;

ජාතික ප්‍රශ්නයට සාමකාමී දේශපාලන විසඳුමක් ඇති කර ගැනීම පිණිස ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් සද්භාවයෙන් යුතුව දරන ලද ප්‍රයත්නයන් නොසලකාම, එබඳු ත්‍රස්තවාදී ක්‍රියා සිදු කිරීමේ නියැලී සිටින එම තැනැත්තන් සහ සංවිධාන විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඇතැම් කොටස්වල වෙනම රාජ්‍යයක් පිහිටුවීමේ ඔවුන්ගේ අරමුණ ඉටුකර ගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙන් ඔවුන්ගේ උද්දේශිත ස්වාධීනත්වය ඒක පාර්ශ්විකව ප්‍රකාශයට පත් කිරීමට ඉඩ ඇතැයි දැන් පෙනී යන හෙයින් ද;

පූර්වෝක්ත කරුණු හේතුකොටගෙන, රටේ හදිසි තත්ත්වයක් පවත්නා අතර, එම තත්ත්වය, ජාතියේ සහ මහජන ආරක්ෂාවට, ජනතාවගේ යථා පැවැත්මට සහ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාමට අහිතකර බව මගේ මතය වන හෙයින් ද;

මහජන ආරක්ෂාව, ජනතාවගේ යථා පැවැත්ම සහ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාම යන කරුණු සඳහා තවදුරටත් සිදුවන එබඳු ත්‍රස්තවාදී ක්‍රියා සහ වෙනත් නිශ්චිත ත්‍රස්තවාදී කටයුතු වැළැක්වීමට, මැඩපැවැත්වීමට, අවසන් කිරීමට සහ තහනම් කිරීමට අවශ්‍ය වන හෙයින් ද;

ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වන, ත්‍රස්තවාදය වැළැක්වීම හා මැඩපැවැත්වීම සම්බන්ධ අන්තර් ජාතික සම්මුති සහ විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ VII පරිච්ඡේදය යටතේ 2001 සැප්තැම්බර් මස 28 වැනි දින සම්මත කර ගන්නා ලද එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ, (2001) අංක 1373 දරන යෝජනා සම්මතය ඇතුළු නෛතික බැඳීම් ඇති කෙරෙන අන්තර් ජාතික නෛතික සාධන පත්‍ර මගින් ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී ඇති බැඳීම් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ ප්‍රකාර නියෝග සෑදීමට ජනාධිපතිවරයා අදහස් කරයි.

වර්ෂ දෙදහස් හයක් වූ දෙසැම්බර් මස 06 වැනි දින කොළඹ දී අත්සන් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

---

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. සී. එෆ්. 1/64

**(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත**

(40 වන අධිකාරය) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2006 දෙසැම්බර් මස 06 වැනි දින.
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2006 අංක 7 දරන හදිසි අවස්ථා (ත්‍රස්තවාදය සහ නිශ්චිත ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් වැළැක්වීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. සාමය ඇති කිරීමට සහ ජාතික ප්‍රශ්නය දේශපාලන වශයෙන් විසඳීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව විසින් සද්භාවයෙන් දරන ලද ප්‍රයත්න සහ ගන්නා ලද ක්‍රියාමාර්ග නොතකා ඇතැම් තැනැත්තන් සහ සංවිධාන විසින් සිදු කරනු ලබන ත්‍රස්තවාදී ක්‍රියා මගින්, විශේෂයෙන්ම එකී ජනරජයෙන් වෙන්වී, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භූමියෙහි ඇතැම් කොටස්වල වෙනම ස්වෛරී රාජ්‍යයක් පිහිටුවීමේ චේතනාවෙන් යුතුව ඇතැම් තැනැත්තන් සහ සංවිධාන විසින් සිදුකරනු ලබන, ත්‍රස්තවාදී ක්‍රියා මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භෞමික අඛණ්ඩතාවය සහ පරමාධිපත්‍යය, තවදුරටත් තර්ජනයට සහ අනතුරට පාත්‍රවී ඇත.

3. එකී ත්‍රස්තවාදී ක්‍රියාකාරම්වල තීව්‍රභාවය සහ ස්වභාවය, ජාතික සහ මහජන ආරක්ෂාවට, ජනතාවගේ, යථා පැවැත්මට සහ ජන ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාමට අහිතකර අන්දමින් නොකඩවා පැවතෙමින් ඇත.

4. ජාතික ප්‍රශ්නයට සාමකාමී දේශපාලන විසඳුමක් ඇති කර ගැනීම පිණිස ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් සද්භාවයෙන් දරන ලද ප්‍රයත්න නොතකා, එබඳු ත්‍රස්තවාදී ක්‍රියා සිදු කිරීමේ නියැලී සිටින එම තැනැත්තන් සහ සංවිධාන විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඇතැම් කොටස්වල වෙනම රාජ්‍යයක් පිහිටුවීමේ ඔවුන්ගේ අරමුණ ඉටුකර ගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙන් ඔවුන්ගේ උද්දේශිත ස්වාධීනත්වය ඒක පාර්ශ්විකව ප්‍රකාශයට පත් කිරීමට ඉඩ ඇතැයි දැන් පෙනී යයි.

5. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදය යටතේ 2001 සැප්තැම්බර් මස 28 වැනි දින සම්මත කර ගන්නා ලද එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ, (2001) අංක 1373 දරන යෝජනා සම්මතය ඇතුළු ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වන්නා වූ, අන්තර් ජාතික සම්මුති සහ ත්‍රස්තවාදය වැළැක්වීම හා මැඩපැවැත්වීම සම්බන්ධ නෛතික බැඳීම් ඇති කෙරෙන අන්තර් ජාතික නෛතික සාධන පත්‍ර මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී ඇති බැඳීම් සාර්ථක ලෙස බලාත්මක කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, ත්‍රස්තවාදය වැළැක්වීම, මැඩපැවැත්වීම සඳහා ආණ්ඩුව විසින් වැදගත් පියවර ගැනීමට බැඳී සිටී.

6. සංවිධානයක් ඇතුළු සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නොලැබූ කිසිම තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් විසින් පුද්ගලිකව හෝ කණ්ඩායමක් වශයෙන් හෝ වෙනත් තැනැත්තන් මගින් හෝ -

(අ) ත්‍රස්තවාදයෙහි; හෝ
(ආ) යම් නිශ්චිත ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වල ; හෝ
(ඇ) යම් ත්‍රස්තවාදී ක්‍රියාවක් හෝ නිශ්චිත ත්‍රස්තවාදී ක්‍රියාකාරකමක් සාක්ෂාත් කර ගැනීම උදෙසා යම් තැනැත්තකු කණ්ඩායමක් හෝ තැනැත්තන් කණ්ඩායමක් විසින් සිදු කරනු ලබන වෙනත් යම් ක්‍රියාකාරකමක,

නිරත නොවිය යුතු ය.

7. කිසිම තැනැත්තකු විසින්, මේ නියෝගවල 6 වන නියෝගය උල්ලංඝනය කරමින් යම් තැනැත්තකුගේ, කණ්ඩායමක හෝ තැනැත්තන් කණ්ඩායමක හෝ සංවිධානයක -

(අ) නිළඇඳුම්, ඇඳුම්, සංකේත, ලාංජන පැළඳීම, ප්‍රදර්ශනය කිරීම සහ සන්තකයේ තබාගැනීම හෝ කොඩිය ප්‍රදර්ශනය කිරීම, එසවීම හෝ සන්තකයේ තබාගැනීම;
(ආ) රැස්වීමක් කැඳවීම, රැස්කිරීම. පැවැත්වීම හෝ ඊට සහභාගි වීම;
(ඇ) සාමාජිකත්වය ලබා ගැනීම හෝ බැඳීම;
(ඈ) සාමාජිකයකුට, සමූහයකට හෝ වෙනත් යම් ආශ්‍රිතයකුට රැකවරණය සැලසීම, ඔහු සහවා තබා ගැනීම, ඔහුට ආධාර කිරීම;
(ඉ) ප්‍රවර්ධනය කිරීම, දිරිගැන්වීම, ආධාර කිරීම, උපදෙස් දීම, සහාය දීම සහ වෙනුවෙන් ක්‍රියා කිරීම;
(ඊ) යම් ක්‍රියාකාරකමක් හෝ සිද්ධියක් සංවිධානය කිරීම හෝ ඊට සහභාගි වීම

නොකල යුතු ය.

8. මේ නියෝගවල 6 වන සහ 7 වන නියෝග උල්ලංඝනය කරමින් ක්‍රියා කරන්නා වූද යම් සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නොලැබූවා වූද, යම් තැනැත්තකු, කණ්ඩායමක් හෝ පුද්ගල කණ්ඩායමකට හෝ එවැනි තැනැත්තකු, කණ්ඩායමක් හෝ පුද්ගල කණ්ඩායමක සාමාජිකයකු, සමූහයක් හෝ ආශ්‍රිතයකු දායක මුදල් සැපයීම, ඉඩ සැලසීම, පරිත්‍යාග කිරීම, විකිණීම, ඔවුන් වෙනුවෙන් මිළදී ගැනීම, කුලියට දීම, බද්දට දීම, ලබා ගැනීම, සැපයීම, අරමුදල් සැපයීම, බෙදාහැරීම හෝ ද්‍රව්‍යමය හෝ අන්‍යාකාරයක දෙයක් ණයට දීම ඇතුළු කවර හෝ ආකාරයක යම් ගණුදෙනුවක කිසිම තැනැත්තකු නොයෙදිය යුතු ය.

එසේ වුව ද, සාමකාමී දේශපාලන විසඳුමක් ඇතිකිරීම, ත්‍රස්තවාදය හෝ යම් නිශ්චිත ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් අවසන් කිරීම, ජනජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාම, සංවර්ධන ක්‍රියාකරකම් පවත්වාගෙන යාම යන අරමුණු සුසාධ්‍යකරණය අරමුණු කොට හෝ වෙනත් යම් නීත්‍යානුකූල ජාතික හෝ ජාත්‍යන්තර, රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධානයක් ඇතුළු යම් තැනැත්තකු විසින් මෙහි 6 වන සහ 7 වන නියෝග උල්ලංඝනය කරමින් ක්‍රියාකරන යම් තැනැත්තකු හෝ කණ්ඩායමක් හෝ පුද්ගල කණ්ඩායමක් සමග සද්භාවයෙන් සහ මේ නියෝග ප්‍රකාර පත් කරන ලද නිසි බලධරයාගේ ලිඛිත අනුමතිය ඇතිව, යම් අනුමත ගණුදෙනුවක නියැලීම නීත්‍යානුකූල වන්නේ ය.

එසේම තවදුරටත්, මෙහි 6 වන සහ 7 වන නියෝග උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකුට හදිසි වෛද්‍ය ප්‍රතිකාර හෝ වෛද්‍ය සහාය ලබාදීම සඳහා නිසි බලධරයාගේ එවැනි අනුමතියක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නේ ය.

9. මේ නියෝගවල 6 වන නියෝගය උල්ලංඝනය කරමින් කටයුතු කරන යම් තැනැත්තකුට, කණ්ඩායමකට, පුද්ගල කණ්ඩායමකට හෝ සංවිධානයකට, ජාතික ආරක්ෂාවට අහිතකර ලෙස බලපාන හෝ අගතියක් සිදුවන යම් තොරතුරක් කිසිම තැනැත්තකු විසින් සැපයීම නොකළ යුතු ය.

10. මේ නියෝගවල 6 වන නියෝගය උල්ලංඝනය කරමින් කටයුතු කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහාධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු දහයකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමේ දණ්ඩනයකට යටත් විය යුතු ය.

11. මේ නියෝගවල 7 වන සහ 9 වන නියෝග උල්ලංඝනය කරමින් කටයුතු කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහාධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු දහයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට යටත් විය යුතු ය.

12. මේ නියෝගවල 8 වන නියෝගය උල්ලංඝනය කරමින් කටයුතු කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහාධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දහය දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමකට යටත් විය යුතු ය.

13. මේ නියෝග යටතේ වරදක් සිදු කිරීම, සිදු කිරීමට තැත් කිරීම, අනුබල දීම, හෝ එහි කටයුතු කිරීම සඳහා කුමන්ත්‍රණය කරන්නා වූ යම් තැනැත්තකු මෙයින් වරදකට වරදකරු කරනු ලබන අතර මහාධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු හතක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමකට යටත් විය යුතු ය ;

14. යම් පුද්ගල මණ්ඩලයක් විසින් මේ නියෝග යටතේ යම් වරදක් සිදු කරනු ලබන අවස්ථාවක දී, එවිට වරද සිදු කිරීම සඳහා සෘජුවම වග කියනු ලැබිය යුතු තැනැත්තාට අමතරව -

(අ) එම තැනැත්තා පුද්ගල මණ්ඩලයක් නම්, එකී පුද්ගල මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකුම සහ එහි ප්‍රධාන විධායක නිලධරයා ;

(ආ) එම පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් නම්, එකී හවුල් ව්‍යාපාරයේ සෑම කොටස්කරුවකුම සහ ප්‍රධාන විධායක නිලධරයා ;

(ඇ) එම පුද්ගල මණ්ඩලය, වෙළඳ ආයතනයක් නොවන්නා වූ සංස්ථාගත කරනු නොලැබූ ආයතනයක් වන අවස්ථාවක දී, එකී පුද්ගල මණ්ඩලය, කණ්ඩායම හෝ සංවිධානය සහ එහි කළමනාකරණය හෝ පාලනය සඳහා වගකිවයුතු සෑම නිලධරයකු ම,

එකී පුද්ගල මණ්ඩලයට අමතරව එම වරද සඳහා වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

එසේ වුව ද, එම තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය විසින් එම වරද තමාගේ අනුදැනුම නොමැතිව හෝ එම වරද සිදුවීම වැළැක්වීම සඳහා තමා නිසි උද්යෝගයෙන් කටයුතු කළ බවට ඔප්පු කරනු ලබන්නේ නම් එකී පුද්ගලයා හෝ පුද්ගල මණ්ඩලය වරදකට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

15. මේ නියෝගවල කාර්ය සඳහා නිසි බලධරයා ලෙස නමින් හෝ ධුරයෙන් යම් තැනැත්තකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

16. මේ නියෝගවල 15 වන නියෝගය ප්‍රකාර පත් කරන ලද නිසි බලධරයා විසින්, සාමකාමී දේශපාලනමය විසඳුමක් ලබාදීම සුසාධ්‍යකරණය සඳහා, ත්‍රස්තවාදය හෝ නිශ්චිත ත්‍රස්ත ක්‍රියාකාරකම් අවසන් කිරීම ජනජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් හා සේවා පවත්වාගෙන යාම, මානව සහයෝගිතාව සැපයීම, සංවර්ධන කටයුතු සිදුකිරීම හෝ වෙනත් යම් නීත්‍යානුකූල කාර්යයන් සඳහා කොන්දේසි රහිතව හෝ නිශ්චිත කොන්දේසිවලට යටත්ව මේ නියෝගවල 6 වන හෝ 7 වන නියෝග උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු, කණ්ඩායමක් හෝ පුද්ගල කණ්ඩායමක් සමග යම් නිශ්චිතව පෙන්වා දෙනු ලබන නෛතික ගනුදෙනුවල යෙදී සිටින යම් තැනැත්තකු, කණ්ඩායමක් හෝ පුද්ගල කණ්ඩායමක් සඳහා අනුමතය ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

17. මේ නියෝගවල 15 වන නියෝගය ප්‍රකාර ක්‍රියාකරමින් නිසි බලධරයා විසින් ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු එම තීරණයේ සිට දින තිහක් ඇතුළත මෙම නියෝග ප්‍රකාර පිහිටුවනු ලබන අභියාචන විනිශ්චය අධිකාරය වෙත එම තීරණයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත.

18. 17 වන නියෝගයේ සඳහන් අභියාචන විනිශ්චය අධිකාරිය රාජ්‍ය ආරක්ෂක, මුදල්, ජාතිය ගොඩනැගීමේ, සැළසුම් ක්‍රියාත්මක කිරීමේ සහ අධිකරණ යන අමාත්‍යාංශවල ලේකම්වරුන් ගෙන් සමන්විත විය යුතු ය. නිසි බලධරයා විසින් මෙම නියෝගවල 14 වන නියෝගය ප්‍රකාර කරන ලද තීරණ කොන්දේසි සහිතව හෝ කොන්දේසි රහිතව අභියාචන විනිශ්චය අධිකාරිය විසින් ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

19. මේ නියෝග ප්‍රකාර ක්‍රියාමාර්ග ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් විශේෂයෙන් බලය පවරනු ලැබූ යම් රාජ්‍ය සේවකයකු හෝ වෙනත් යම් තැනැත්තකු සද්භාවයෙන් ක්‍රියා කර ඇත්නම් සහ ඔහුගේ රාජකාරී කටයුතු අතරතුර දී ක්‍රියා කර ඇත්නම් එම රාජ්‍ය සේවකයාට හෝ වෙනත් යම් තැනැත්තාට එරෙහිව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

20. මේ නියෝගවල කාර්ය සඳහා -

"ත්‍රස්තවාදය" යන්නෙන් #

(අ) ප්‍රචණ්ඩත්වය, බලහත්කාරය, බලයෙන් නම්මා ගැනීම, හෝ බියවැද්දීම, බිය වැද්දීමෙන් නීතිවිරෝධී යමක් බලෙන් කරවීම තර්ජනය හෝ

(ආ) ජාතික ආරක්ෂාවට තර්ජනයක් හෝ අනතුරක් වන ; හෝ

(ඇ) සාමාන්‍ය වැසියන් හෝ එහි කණ්ඩායමක් බිය ගැන්වීම ; හෝ

(ඈ) මහජන සාමයට, සහ ජනජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාම, කඩාකප්පල් කරන හෝ ඊට තර්ජනය කරන ; හෝ

(ඉ) දේපළවලට විනාශයක් හෝ අලාභහානි සිදු කරන ; හෝ

(ඊ) යම් ක්‍රියාවක් සිදු කරන තැනැත්තාගේ ජීවිතය හැර, වෙනත් තැනැත්තකුගේ ජීවිතයක් අනතුරට භාජනය වන ; හෝ

(ඌ) මහජනතාවගේ හෝ මහජනතාවගෙන් කොටසකගේ සෞඛ්‍යයට බරපතල අවදානමක් ඇතිකරවන ; හෝ

(ඍ) විද්‍යුත් පද්ධතියකට බාධා පැමිණවීමට හෝ එය කඩාකප්පල් කිරීමට නිර්මාණය කරනු ලැබූ යම් නීතිවිරෝධී ක්‍රියාවක් වන්නා වූද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ස්වෛරීභාවයට හෝ එහි භෞමික අඛණ්ඩතාවයට නැතහොත් වෙනත් යම් පිළිගත් ස්වෛරී රාජ්‍යයක ස්වෛරීභාවයට හෝ භෞමික අඛණ්ඩතාවයට නැතහොත් යම් දේශපාලන හෝ ආණ්ඩු වෙනසකට තර්ජනයක් හෝ අනතුරක් ඇතිකිරීම ඉලක්ක කරගෙන හෝ ඒ සඳහා කැප වූ යම් නීති විරෝධී ක්‍රියාවක් වන්නාවූද නැතහොත් යම් ක්‍රියාවක් සිදු කිරීමට හෝ සිදු කිරීමෙන් වැළකී සිටීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවට බලපෑම් කිරීම අරමුණ ඉලක්ක කරගෙන යම් නීතිවිරෝධී ක්‍රියාවක් වන්නා වූද, යම් ක්‍රියාවක් අදහස් වන අතර ඊට එම නීති විරෝධී ක්‍රියාව සඳහා උපදෙස් දෙන හෝ එය දිරිමත් කරන වෙනත් යම් නීතිවිරෝධී කටයුත්තක් ද ඇතුළත් වේ.

"විශේෂිත ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්" යන්නෙන් -

1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ නිශ්චිතව දැක්වෙන යම් වරදක්, (40 වන අධිකාරය) වූ මහජන ආරක්ෂක ආඥාපනත යටතේ වූ වරදක්, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ 3 වන වගන්තිය යටතේ වූ වරදක්, 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ සම්මුතිය පනතේ 3 වන වගන්තිය යටතේ වූ වරදක් සහ (15 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 114, 115, 116, 117, 121, 122, 128 සහ 129 යන වගන්ති යටතේ සිදු කරන ලද යම් වරදක් අදහස් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.